*සැ. යු. -* (i) 2025.04.04 වැනි දින පළ කරන ලද අංක 2431 *ගැසට් පත්‍රයේ* II සහ IV (අ) කොටස් පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2025 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,432 - 2025 අප්‍රේල් මස 11 වැනි සිකුරාදා - 2025.04.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 72 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 75 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 මැයි මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අප්‍රේල් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම

## රුවන්වැල්ල දිසා අධිකරණයේ දී ය

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම

සෙලාන් බැන්ක් පීඑල්සී,
(කලින් සෙලාන් බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින් වූ)
සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

*නඩු අංකය* : 26 MB
*ස්වභාවය* : උකස්
*වටිනාකම* : රු. 3,354,975/06
*ඇස්කිසි අංකය* :

...............*පැමිණිලිකරු.*

*එදිරිව*

01. හෙට්ටි ආරච්චිගේ කාංචනා ඉරෝෂමාලා,
"සමන්පාය",
අටලුගම, දෙහිඕවිට.

අංක A 190/2, මහ වීදිය, කන්නත්තොට.

02. කුඩාමඩුවගේ දුමින්ද සම්පත් ජයරත්න,
අංක ඊ 62,
පන්සල පාර, කන්නත්තොට.

03. වර්ණකුලසූරියගේ ශ්‍රියාලතා,
අංක බී 58,
එරබදුවල, කන්නත්තොට.

...............*විත්තිකරුවන්.*

රුවන්වැල්ල දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2023ක් වූ ඔක්තෝබර් මස 25 වැනි දිනැති ඒකපාක්ෂික නඩු තීන්දුව අනුව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුව වෙත රුපියල් තිස් ලක්ෂ හැටපන් දහස් හාරසිය පනස් හතයි ශත හැට හතරක (රු. 3,065,457.64) මුදල ද වර්ෂ 2015.12.10 දින සිට එකී මුදල පැමිණිලිකරු වෙත සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දින තෙක් රුපියල් විසිහතර ලක්ෂ තිස් හත් දහස් නවසිය පනස් හතයි ශත විසි තුනක (රු. 2,437,957.23) මුදල මත 18% බැගින් වාර්ෂික පොළියක් ද සහ ඉහත කී දෙලක්ෂ අසූනව දහස් පන්සිය දාහතයි ශත හතලිස් දෙකක (රු. 289,517.42) මුදල ද, වර්ෂ 2015.12.10 දින සිට එකී මුදල පැමිණිලිකරු වෙත සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දින තෙක් වර්ෂයකට රුපියල් දෙලක්ෂ හැටහතර දහස් හත්සිය අසූ එකයි ශත දොළහක (රු. 264,781.12) මුදල මත 20.5% බැගින් වාර්ෂික පොළියක් ද, 1 වන විත්තිකරු විසින් පැමිණිලිකරු වෙත ගෙවිය යුතු බවට නියෝග කොට ඇති හෙයින්, ඒ අනුව විත්තිකරුවන්ට එරෙහිව ක්‍රියාවේ යෙදවීම සඳහා මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරී පත්‍රයේ බලයපිට දැනටමත් තහනමට ගෙන ඇති දේපළ,

**වර්ෂ 2025ක් වූ අප්‍රේල් මස 29 වැනි දින ප. ව. 1.00 ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරළේ, මෙගොඩපොත පත්තුවේ, රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙ හි අංක 109 කන්නත්තොට ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, කන්නත්තොට ගමෙහි පිහිටි "තේක්කගහමුල පැලවත්ත" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ආර්. ඒ. එම්. එම්. ඒ. බටන්ගල විසින් මැන සාදන ලද 2013.03.08 වන දිනැති අංක 0918 දරන පිඹුර ප්‍රකාර ලොට් 01 සඳහා මායිම් :

*උතුරට* : පිඹුරු අංක 3026 හි ලොට් 7 සහ 10 ද,
*නැගෙනහිරට* : ප්‍රධාන පාර ද,
*දකුණට* : මෙම ඉඩමේ ම ඉතුරු කොටස ද,
*බස්නාහිරට* : ගුරුගොඩ ඔය ද,

යන මායිම් තුළ වූ පර්චස් දොළහයි දශම හතයි පහයි එකක් (පර්. 12.751) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේ ද සමග වේ.

මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු U 11/102 හි ලියාපදිංචි වී ඇත.

*දේපළට ගමන් මග.-* රුවන්වැල්ල නගරයේ සිට කෑගල්ල දෙසට කි. මී. 5.4 ක් වරාවල හන්දිය පසුකරනවාත් සමගම වමට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

(1) සම්පූර්ණ මුදල ගෙවන්නේ නැතිනම් ගැණුම් මිලෙන් 25% ;
(2) ප්‍රචාරණ වියදම් ;
(3) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද ;

සම්පූර්ණ මුදල නොගෙවන්නේ නම් ගැණුම් මිලෙන් 75%ක් ද, ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත රුවන්වැල්ල දිසා අධිකරණයේ ඉහත නඩුවට බැර කළ යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමණාකරු - දේපළ අංකය, සෙලාන් බැන්ක්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

011-2456485, 011-2456479, 011-2456473

ඩී. පී. නිමාලි දිල්රුක්ෂි,
රෙජිස්ට්‍රාර්,
දිසා අධිකරණය, රුවන්වැල්ල.

04-104

---

**මීගමුව දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

*නඩු අංකය* : 3420/MB
*ස්වභාවය* : උගස්කරය
*වටිනාකම* : රු. 403,191.43/-
*ඇස්කීසි අංකය* : 92/2024

කොච්චිකඩේ, හලාවත පාරේ, අංක 96 ඒ දරන ස්ථානයේ, "කොච්චිකඩේ ශාඛාව" යනුවෙන් හැඳින්වෙන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී.

............*පැමිණිලිකරු.*

*එදිරිව*

01. සඳලංකාව, හැන්ඩියගල, විජය උළු කර්මාන්ත ශාලාවේ බැන්නැහැක මුදියාන්සේලාගේ වන්දන බැන්නැහැක.

02. සඳලංකාව, හැන්ඩියගල, බැන්නැහැක මුදියන්සේලාගේ මංගලිකා සේපාලි.

............*විත්තිකරුවෝ.*

වර්ෂ 2014 ක් වූ අප්‍රේල් මස 02 වැනි දින මෙම නඩුවේ ඇතුලත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

(අ) පැමිණිල්ලේ ආයාචනයේ (අ) ඡේදයේ අයැද ඇති පරිදි රු. 312,500/-ක මුදලක් ද, 2008 අගෝස්තු මස 31 වැනි දා දක්වා නොගෙවූ පොළිය වශයෙන් රු. 90,691.43/- ක තවත් මුදලක් ද යනුවෙන් එකතුව රු. 403,191/43 වන්නා වූ මුදලක් ද එකී රු. 312,500/- ක මුදල මත 2008 සැප්තැම්බර් මස 01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 21% බැගින් පොලිය ද ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශය කර ඇති හෙයින් ද,

(ආ) ඉහත නම් සඳහන් 1 වන සහ 2 වන විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට අධිකරණයේ නිලධාරියෙකු විසින් නියමිත පරිදි තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට ද නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

තීන්දු ප්‍රකාශයේ සහ මෙහි උපලේඛනයේ හි විස්තර කර ඇති එකී ඉඩම සහ ස්ථාන ඉහත කී මුදල් ප්‍රමාණයන් අයකර ගැනීම සඳහා බන්ධනය වී ඇති බවට සහ ඇස්කිසි කළ හැකි බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

මා විසින් 2024.11.13 වැනි දින තහනම් කරන ලද පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී,

**වර්ෂ 2025ක් වූ මැයි මස 16 වැනි දින පෙ. ව. 10.00 ට,**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ ඇතුළත පිටිගල් කෝරලේ, කටුගම්පල හත් පත්තුවේ, හැන්ඩියගල පිහිටි සියඹලාගහමුල වත්තේ, අංක 11 බිම් කැබැල්ල යනුවෙන් හැඳින්වෙන එම සම්පූර්ණ ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ සියල්ල සහිතවයි. එකී ඉඩමට මායිම් : උතුරට - අංක 8 බිම් කැබැල්ල, නැගෙනහිරට - අංක 17 බිම් කැබැල්ල, දකුණට - අංක 12 බිම් කැබැල්ල, බස්නාහිරට - එම්. ජේ. එම්. රන්මැණිකාට අයත් ඉඩම සහ එහි ප්‍රමාණය රූඩ් එකයි පර්චස් දහ තුනයි දශම තුනයි තුන (රූ. 1, පර්. 13.33) ක් මෙය එස් 60/169 හි ලියා පදිංචි කර ඇත.

මෙය පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

ඉහත කී හැන්ඩියගල පිහිටි සියඹලාගහමුල වත්තේ අංක 11 බිම් කැබැල්ල එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ සියල්ල සහිතවයි. බලයලත් මිනින්දෝරු තැන්පත් ආර්. බී. නවරත්න විසින් සාදන ලද අංක 4973 සහ 2004/12/07 වන දින දරන සැලැස්ම අනුව එකී බිම් කැබැල්ලට මායිම් : උතුරට - අංක 3082 දරන සැලැස්මේ අංක 8 බිම් කැබැල්ල සහ දැන් එච්. එම්. විජේරත්නට අයත් ය. නැගෙනහිරට - අංක 3082 දරන සැලැස්මේ අංක 17 බිම් කැබැල්ල දැන් එච්. එම්. විජේරත්නට අයත් ය. බස්නාහිරට - කලින් එම්. ජේ. එම්. රන්මැණිකාට අයත්ව තිබූ දැන් චන්දන බැන්නැහැකට අයත් ඉඩම සහ එහි ප්‍රමාණය රූඩ් එකයි පර්චස් දහ තුනයි දශම එකයි තුන (රූ. 1, පර්. 13.13) ක් වේ.

අංක 3082 දරන සැලැස්මේ අංක 17 බිම් කැබැල්ල වශයෙන් නිරූපිත පාර මත මාර්ග අයිතිය සහිතවයි.

*ඉඩමට පිවිසීම.*- දංකොටුව-පන්නල පාරේ වැටකෙයාව හංදියේ සිට ශ්‍රී අභයතිස්ස නාහිමි මාවතට දකුණට හැරී විලගෙදර පාරේ කිලෝමීටර් 1.5ක් ගමන් කර එතනින් දකුණට හැරී (ශ්‍රී විජය සදහම් විහාරය නාම පුවරුවේ සිට) මුත්තෙට්ටුව පාරේ මීටර් 700ක් ගමන් කර එතනින් වමට හැරී බොරළු පාරේ මීටර් 250ක් පමණ ගමන් කළ විට දකුණු පැත්තට වන්නට ඇති ඉඩම වෙත ළඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් නියෝජ්‍ය පිස්කල් වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ක් දේපළ මිල දී ගත් වහාම ගෙවිය යුතු වන අතර, ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය අනුව ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් පළමු රු. 7,500/- සඳහා රු. 150/- ක නඩු ගාස්තුවක් ද, රු. 7,500/- ඉක්මවන සෑම රු. 1,000/- ක් සඳහාම රු. 5/- බැගින් පිස්කල් ගාස්තු සහ විකුණුම් සඳහාවන සියලුම වියදම් ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/පිස්කල්,
දිසා අධිකරණය,
කුලියාපිටිය.

වර්ෂ 2025ක් වූ මාර්තු මස 19 වැනි දින දී ය.

04-115

# විවිධ දැන්වීම්

## කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දී ය

*නඩු අංකය* : HC/CIVIL 86/2024/CO
*ස්වභාවය* : ගණන් බේරා වසා දැමීම

අත්තිඩිය, පැරකුම් මාවත, 05 වන පටුමග, අංක 31/18 හි ලියාපදිංචි ලිපිනය පිහිටි පීඑස්කේ. ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් (ලියාපදිංචි අංක PV 111871) පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලැබීම සඳහාවන ඉල්ලීම පිළිබඳ කාරණාවේ දී ය.

නවරත්න ඉෂාර උදයන්ගන,
අංක 307, අත්තිඩිය පාර,
දෙහිවල.

...............*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් සමාගම ගණන් හිලව් බේරා වසා දැමීම සඳහා සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය වෙත 2024 දෙසැම්බර් 09 වැනි දින පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම 2025 අප්‍රේල් මස 24 දින අධිකරණය ඉදිරියේ දී ඇසීමට නියමකර ඇති බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ. එම පෙත්සම පිළිබඳව නියෝගයක් ලබාදීමට කැමති හෝ ඊට විරුද්ධ වන ඕනෑම ණය හිමියෙකුට හෝ එකී සමාගමෙහි දායකයෙකුට නඩුව කැඳවන අවස්ථාවේ දී පුද්ගලිකව හෝ සිය නීතිඥවරයා මාර්ගයෙන් පෙනී සිටිය හැකි අතර, පෙත්සමෙ හි පිටපතක් එය අවශ්‍ය කෙරෙන ඕනෑම ණය හිමියෙකුට එකී සමාගමෙ හි දායකයෙකු වෙත ඒ සඳහාවන නියමිත ගාස්තු ගෙවීමෙන් පසුව පහත අත්සන් තබා ඇති අය විසින් ලබා දෙනු ඇත.

*අත්සන් කළේ*: කේ. දනුක ලක්මාල්,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 174, අලුත්කඩේ වීදිය, කොළඹ 12.

***සටහන*** : එකී පෙත්සම අඩගසනු ලබන අවස්ථාවට පෙනී සිටීමට කැමැත්තක් දක්වන ඕනෑම පුද්ගලයෙකුට ඔහු එසේ කැමැත්තෙන් සිටින බව ඉහත නම් සඳහන් පෙත්සම්කරුගේ නීතිඥවරයා වෙත ලිඛිතව තැපෑලෙන් දැන්විය යුතුය. *නැතහොත්* ගෙනැවිත් භාරදිය යුතුය. එසේ *නැතහොත්* තම නීතිඥවරයා (සිටී නම්) මාර්ගයෙන් බාර දිය යුතු ය. තැපෑලෙන් එවනු ලබන්නේ නම් **2025 අප්‍රේල් මස 23 වැනි දින පස්වරු 6.00** ට පෙර ඉහත නම් සඳහන් අය වෙත ලැබෙන පරිදි එවිය යුතුය.

පෙත්සම්කරුගේ නීතිඥ.

04-86

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.